# මියන්මාරය හා ලංකාව

රනිල් වික්‍රමසිංහ මහතා හා එ ජා පක්ෂය සන්ධීය හෙවත් ෆෙඩරල් රාජ්‍ය සංකල්පය අත්හැරියේ නමක් නැතිව සන්ධීය රාජ්‍යයක් පිහිටුවීමට බව අපි පසුගිය සතියේ කීවෙමු. ඒ බව ඒ පක්ෂය මේ සතියේ කොටි සංවිධානය සමග නැවත සාකච්ඡා ඇරඹිය යුතු ය යනුවෙන් ප්‍රකාශකිරීම සමග තවත් තහවුරු වෙයි. එ ජා පක්ෂයට අවශ්‍ය කොටි සමග කෙරෙන සාකච්ඡා ඔස්සේ සන්ධීය නම නොමැතිව සන්ධීය රාජ්‍යයක් පිහිටුවීමට ය. මෙය බටහිර ඊනියා ජාත්‍යන්තර ප්‍රජාවගේ ද අභිලාෂය වෙයි. දෙමළ ජනයාගේ යැයි කියන අභිලාෂය “ජාත්‍යන්තර ප්‍රජාවගේ” අභිලාෂය මිස අනෙකක් නො වේ. කොටි සමග සාකච්ඡා අවශ්‍ය නැත යනුවෙන් හා ඒකීය රාජ්‍යයක බලය ජනතාව අතට පත්කිරීම ගැන තවදුරටත් සාකච්ඡා කිරීමට අවශ්‍ය නමුත් මියන්මාරයේ සිදුවන්නේ කුමක් ද යන්න පිළිබඳව කෙටියෙන් හෝ සටහන් කිරීමට අවශ්‍ය බැවින් එකී සාකච්ඡාව කල්තැබීමට සිදුවෙයි.

මියන්මාරයේ පෙළපාලි ගිය භික්ෂූන් වහන්සේ ඝාතනය කිරීම අපේ දැඩි කණස්සල්ලට හේතුවෙයි. එහෙත් ඒ භික්ෂූන් වහන්සේගේ පෙළපාලි යැම් පිළිබඳ ව මෙරට ප්‍රධාන බිෂොප්වරු මහත් උනන්දුවෙන් ඒ භුවාදක්වමින් කතාකරන විට මේ බිෂොප්වරු ලංකාවේ සිදු වූ භික්ෂු ඝාතන ගැන කතානොකෙළ් ඇයි ද යන ප්‍රශ්නය මතුවෙයි. එමෙන් ම ලංකාවේ භික්ෂූන් වහන්සේ පෙළපාළි යන විට භික්ෂූන් වහන්සේට දේශපාලනය තරම් නො වේ යැයි කියූ ඇතැම් පුවත්පත් ලේඛක ලේඛිකාවන් මියන්මාරයේ පෙළපාලි යන භික්ෂූන් වහන්සේට ප්‍රශංසා කරමින් ලංකාවේ භික්ෂූන් වහන්සේ ඒ පෙළපාලිවලට සහයෝගය දක්වමින් පෙළපාලි නොයන්නේ ඇයිදැයි ප්‍රශ්න කරන විට බළලා මල්ලෙන් එළියට පනියි.

බටහිර ජාතීන් හෙවත් ඊනියා ජාත්‍යන්තර ප්‍රජාව මියන්මාරයේ පෙළපාලි යන භික්ෂූන් වහන්සේට ප්‍රශංසා කරන්නේත් කොටි සංවිධානයට, බෙදුම්වාදයට, ත්‍රස්තවාදයට, නෝර්වේ රාජ්‍යයට විරුද්ධව ලංකාවේ භික්ෂූන් වහන්සේ පෙළපාලි යන විට භික්ෂූන් වහන්සේට දේශපාලනය තරම් වන්නේ දැයි ප්‍රශ්න කරන්නේත් දෙබිඩි පිළිවෙතක් නිසා නො වෙයි. අපි මෙරට භික්ෂූන් වහන්සේ ගේ දේශපාලනය කුමක් දැයි දනිමු, ඈත අතීතයේ සිට ම භික්ෂූන් වහන්සේ රජුගේත් ජනතාවගේත් අනනුශාසකයෝ වූහ. එහෙත් භාරතයේ බමුණන් මෙන් උන්වහන්සේ රාජ සභාවෙහි (අද නම් පාර්ලිමේන්තුවෙහි) සාමාජිකයෝ නො වූහ. අපි කෙදිනකවත් භික්ෂූන් වහන්සේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වීම අනුමත නො කෙළෙමු. භික්ෂු දේශපාලනය යනු එක් ආකාරයකින් ගත්කල වක්‍ර දේශපාලනයකි. රජුන්ට, පාලකයන්ට අවවාද අනුශාසනා කිරීම, ඔවුන්ට විරෝධය පෑම ථෙරවාද සම්ප්‍රදායෙහි භික්ෂූන් වහන්සේට අකැප නො වෙයි. එබැවින් මියන්මාරයේ භික්ෂූන් වහන්සේ විරෝධතා පෙළපාලිවල නිරතවීම අපට ප්‍රශ්නයක් නො වෙයි. එහෙත් බටහිරයෝ හා මෙරට ඊනියා ප්‍රබුද්ධයෝ ලංකාවේ භික්ෂු දේශපාලනයට විරුද්ධවන අතර මියන්මාරයේ භික්ෂු දේශපාලනයට පක්ෂ වෙති. ඔවුන් එසේ කරන්නේ ඇයි?

බටහිරයන්ට හා ඔවුන් අනුව යන විවිධ රාජ්‍ය නොවන සංවිධානවල දාසයන්ට ප්‍රතිපත්තියක් නොමැතිවීම නිසා එලෙස දෙබිඩි ලෙස පෙනෙන ක්‍රියා මාර්ගයක් අනුගමනය කරනවා නො වෙයි. බටහිරයන්ට මෙන් ම දාසයන්ට ද ප්‍රතිපත්ති වෙයි. දාසයන්ට ඇත්තේ බටහිරයන් කරන කියන දේ මේ රටේ දී අනුකරණය කිරීම ය. බටහිරයන්ගේ ප්‍රතිපත්තිය නම් කිනම් අයුරකින් වුව ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ලෝකයෙහි ප්‍රචලිත කිරීම, ස්ථාපිත කිරීම හා තහවුරු කිරීම ය. බටහිරයෝ අවුරුදු පන්සියයක් පමණ ඒ ප්‍රතිපත්තියෙහි පිහිටා ක්‍රියා කරති. ඒ ප්‍රතිපත්තිය දේශපාලන ආර්ථික හා සංස්කෘතික යටත්විජිතවාදයක් වෙයි. ඒ ප්‍රතිපත්තියට අනුව අද බටහිරයන්ගේ ප්‍රධාන විරෝධතාව මුස්ලිම් සංස්කෘතියට ය. බටහිරයෝ ඉන්පසු ථෙරවාද සංස්කෘතියට විරුද්ධ වෙති.

බටහිරයන්ගේ ප්‍රතිපත්තියෙහි ස්වරූපය කලින් කලට වෙනස් වෙයි. එහෙත් ප්‍රතිපත්තිය දැනට වෙනස් නො වෙයි. ප්‍රතිපත්තිය වෙනස් වනු ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට කිසියම් හේතුවක් නිසා අනාගතයේ දී ඊනියා විසඳුම් නැති ගැටළු පැන නැගුණු විට ය. අද ඇතැමුන් නව යටත්විජිතවාදය යනුවෙන් හඳුන්වන්නේ බටහිරයන්ගේ ඉහත කී ප්‍රතිපත්තියෙහි ස්වරූපය වෙනස් වීමකට ය. ස්වරූපය වෙනස් වුව ද ඔවුන්ගේ මූලික ප්‍රතිපත්තියෙහි වෙනසක් වී නැත. පල්ලි නිකායේ භික්ෂූන් යනුවෙන් හැඳින්වෙන භික්ෂූන් වහන්සේ හැරුණු කොට සමස්තයක් වශයෙන් ගත්කල මෙරට භික්ෂූන් වහන්සේ සිංහලත්වය හා ථෙරවාද බුදු දහම රැකීම වෙනුවෙන් පෙනී සිටිති. ඒ රැකීම සඳහා

© Prof. Nalin De Silva

ඉදිරිපත්වන භික්ෂූන් වහන්සේ බටහිරයන්ගේ ප්‍රතිපත්තියන්ට විරුද්ධ වෙති. දෙමළ ජාතිවාදයට විරුද්ධවීම බටහිරයන්ගේ ප්‍රතිපත්තියට විරුද්ධ වීමකි. මෙරට දෙමළ ජාතිවාදය විශේෂයෙන් ම ඉංගිරීසින් විසින් නිර්මාණය කරනු ලැබුයේ සිංහලත්වය දුර්වල කිරීමට ය; හැකිනම් නැති කිරීමට ය. මෙරට සන්ධීය රාජ්‍යයකට විරුද්ධවීම බටහිරයන්ගේ සිංහලත්වය දුර්වල කිරීමේ ප්‍රතිපත්තියට විරුද්ධවීමකි. එබැවින් සන්ධීය රාජ්‍යයට, මිනීමරු ප්‍රභාකරන්ට විරුද්ධව පෙළපාලි යෑමට බටහිරයෝ විරුද්ධ වෙති.

අනෙක් අතට මියන්මාරයේ හමුදා ආණ්ඩුව එරට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විරුද්ධ ය. බටහිරයන් මියන්මාරයේ හමුදා ආණ්ඩුවට විරුද්ධවන්නේ එබැවිනි. එසේ නොමැතිව ඒ ආණ්ඩුව බටහිරයන් කියන අන්දමට ප්‍රජාතන්ත්‍ර විරෝධී වීම, මානව අයිතිවාසිකම් කඩ කිරීම නිසා නො වේ. බටහිරයන්ට ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් රැකීම ආදිය තම අවශ්‍යතා ඉටුකර ගැනීමට යොදාගත හැකි වචන පමණ ය. බටහිරයන් චිලියේ පිනෙෂොට් රැක්කේ හා ලංකාවේ ප්‍රභාකරන් රකින්නේ ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී බවක් හෝ මානුෂික බවක් හෝ නිසා නොව ඔවුන්ගෙන් බටහිරයන්ගේ අවශ්‍යතා ඉටුවූ හා ඉටුවන බැවිනි. බටහිරයන් මියන්මාරයේ හමුදා ආණ්ඩුවට විරුද්ධ වන්නේ ඒ ආණ්ඩුව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අවශ්‍යතා ඉටු නොකරන බැවිනි. එසේ විරුද්ධවීමේ දී බටහිරයෝ තමන් විරුද්ධ වන්නේ එබැවිනි යැයි නොකියා ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන කතා කරති. බටහිරයන්ගේ වචනවල, ප්‍රකාශවල දෙබිඩි ස්වරූපයක් ඇති නමුදු මූලික ප්‍රතිපත්තියෙහි දෙබිඩි බවක් නැත. එහෙත් ඔවුහු ලෝකයට තම මූලික ප්‍රතිපත්තිය මේ යැයි නො කියති.

ලංකාවේ මෙන් නොව මියන්මාරයේ භික්ෂූන් වහන්සේ දස දහස් ගණනින් වැඩ සිටිති. ඒ භික්ෂූන් වහන්සේගෙන් කී නමක ආණ්ඩු විරෝධී පෙළපාලිවල නිරතවන්නේ දැයි අපි නොදනිමු. අපට අසන්නට කියවන්නට ලැබෙන්නේ බටහිර ආයතන ඔස්සේ ලැබෙන ප්‍රවෘත්ති පමණ ය. අප හමුදා ආණ්ඩුවේ භික්ෂු ඝාතනය හෙළා දකින මුත් ඒ ආණ්ඩුව වෙනුවට අවුන් සාන් සු කී ගේ ආණ්ඩුවක් ඇති කිරීමේ ව්‍යාපාරයකට සහයෝගය දීමට අපට අවශ්‍යතාවක් නැත. අවුන් සාන් සු කී මහත්මිය හා චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අතර සමානකම් වෙයි. දෙදෙනාම ජනාදරයට පාත්‍ර වූ නායකයන්ගේ දියණියෝ වෙති. එහෙත් දෙදෙනාම ථෙරවාද බෞද්ධයන් ලෙස පෙනී සිටින නමුදු ථෙරවාද සංස්කෘතියට වඩා බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියට සමීප වූවෝ වෙති. දෙදෙනාම තම තමන්ගේ රටවලට එංගලන්තයේ සිට පැමිණුනේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ අවශ්‍යතා ඉටු කිරීමට ය. දෙදෙනාම බටහිරයන්ගේ නියෝජිතවරියෝ වෙති. අද මියන්මාරයේ ඇතැම් භික්ෂූන් වහන්සේ පෙළපාලි යන්නේ සු කී මහත්මියගේ සෘජු නායකත්වයකින් නොවනවා විය හැකි ය. එහෙත් ඒ පෙළපාලි සාර්ථක වුවහොත් බලයට පත්වන්නේ ඒ මහත්මිය බව පැහැදිලි ය. බටහිරයන්ට දැනට අවශ්‍ය සු කී මහත්මියගේ නායකත්වයෙන් ආණ්ඩුවක් පිහිටුවීමට ය.

1994 දී එ ජා පක්ෂයෙන් බැට කා සිටි මෙරට ජනතාව චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට බලය ලබාදුන්හ. ඒ අවස්ථාවේ දී ඇයට තනියම බලයක් ලබාදීමේ අවදානම අපි සඳහන් කෙළෙමු. එහෙත් ජනතාව අප කී දැට ඇහුම්කන් නො දී ඇය බලයට පත්කළහ. ඉන්පසු පැකේජයක් ඔස්සේ ඇය බටහිරයන්ට අවශ්‍ය දෑ කිරීමට සැරසුනා ය. බටහිරයන්ට අවශ්‍ය දේ ඇයට කිරීමට නො හැකි බව වටහාගත් බටහිරයෝ රනිල් වික්‍රමසිංහ මහතා ඔස්සේ තම කාර්යය ඉටුකර ගැනීමට සැරසුණහ. සිංහලත්වය රැකීමට ක්‍රියාකරන සිංහලයන්ට හුස්මක් ගැනීමට හැකිවුයේ මෙරටට පෘතුගීසීන් පැමිණීමේ පන්සියවැනි සංවත්සරය ඉතා ඉහළින් සැමරීමට සූදානම් වූ ද, බටහිරයන්ගේ සෘජු නියෝජිතයා වූ ද රනිල් වික්‍රමසිංහ මහතාගේ ආණ්ඩුව පරාජයකර පරිවාස ආණ්ඩුවක් පිහිටුවීමෙන් පසුව ය. අද වික්‍රමසිංහ මහතා නැවතත් සිංහලයන් රවටමින් කසිකබල් මාක්ස්වාදීන් ද සමග එකතු වී සන්ධීය නොකියා සන්ධීය රාජ්‍යයක් පිහිටුවීමට සැරසෙයි. මියන්මාරයේ හමුදා ආණ්ඩුවේ දූෂණ තිබිය හැකි ය. ඒ පෙරළා බටහිර ක්‍රිස්තියානි නූතනත්ව විරෝධී වෙනත් ආණ්ඩුවක් පිහිටුවා ගැනීම එකකි. සු කී මහත්මියගේ බටහිර ගැති ආණ්ඩුවක් පිහිටුවා ගැනීම තවත් එකකි. මියන්මාරයේ ඇතැම් භික්ෂූන් වහන්සේ දැන හෝ නොදැන හෝ පෙළපාලි යන්නේ දැනට සු කී මහත්මියගේ ආණ්ඩුවක් පිහිටුවීමට ය. අපට එයට එකඟවීමට නො හැකි ය. යම් අයුරකින් සු කී මහත්මිය බලයට පත්වී ඇයට බටහිරයන්ගේ අවශ්‍යතා ඉටුකිරීමට නොහැකි වී යැයි සිතමු. එවිට බටහිරයන් මියන්මාරයේ රනිල් වික්‍රමසිංහ බලයට පත්කරනු ඇත. එදින මියන්මාර ථෙරවාද සංස්කෘතියට කණකොකා හඬලනු ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva